Australian Government
Department of Social Services

ඕස්ට්‍රේලියානු රජයේ සහාය

තාවකාලික මානුෂීය රැඳී සිටීමේ (Temporary Humanitarian Stay) (449), තාවකාලික මානුෂීය ගැටළු (Temporary Humanitarian Concern) (786), තාවකාලික රැකවරණය (Temporary Protection) (785) සහ ආරක්ෂක ක්ෂේමස්ථාන (Safe Haven Enterprise) කටයුතු පිළිබඳ (790) වීසාලාභීන්

පටුන

හැඳින්වීම 2
සමාජ ආරක්ෂණ සහ පවුල් සහාය ගෙවීම් 4
වැඩිදුර විස්තර 5
ඉංග්‍රීසි භාෂාව 6
සේවා නියුක්තිය 6
ඔබ ආබාධිත තැනැත්තෙකු නම් 7
සේවක අයිතිවාසිකම් සහ කොන්දේසි 8
වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව 8
සෞඛ්‍ය සේවා 9
සාමාන්‍ය වෛද්‍යවරුන් 9
විශේෂඥ සේවා 10
ඖෂධ 10
රෝහල් 10
හදිසි අවස්ථාවකදී 11
ඔබට ගිලන් රථයක් අවශ්‍ය නම් 11
ගිලන් රථ වියදම් 12
මානසික සෞඛ්‍ය /ආවේගාත්මක සුභසාධන සේවා 12
පූර්ව සෞඛ්‍ය ඇගයීම් සහ මැදිහත් වීමේ සේවා 12
පාසල් යන වයසේ දරුවන් සඳහා අධ්‍යාපනය 13
ඇතුළත් කිරීම ප්‍රතිශක්තිකරණය 14
සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් සපයන සේවා 15
සංකීර්ණ සිද්ධි සහායක සේවා 15
නොමිලේ භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවා 16
නොමිලේ භාෂණ පරිවර්තන සේවා 16
ක්ෂණික දුරකථන භාෂණ පරිවර්තන සේවා 16
කලින් වෙන් කළ දුරකථන භාෂණ පරිවර්තන සේවා 16
එම ස්ථානයේදීම භාෂණ පරිවර්තනය කිරීමේ සේවා 16
නොමිලේ ලබා දෙන පරිවර්තන සේවා 16
වැඩිදුර විස්තර 16

හැඳින්වීම

ඔබ තාවකාලික මානුෂීය රැඳී සිටීමේ (449), තාවකාලික මානුෂීය ගැටළු සහිත (786), තාවකාලික රැකවරණය (785) (TPV) හෝ ආරක්ෂක ක්ෂේමස්ථාන කටයුතු පිළිබඳ (790) (SHEV) වීසාලාභියෙකු නම් ඔබට ඕස්ට්‍රේලියානු රජයේ (Australian Government) සේවා ගණනාවක් ලබා ගැනීමේ හැකියාව ලැබේ.

මෙම අත්වැල මඟින් ඔබට ලබා ගත හැකි සියලුම ආකාරයේ සේවාවන් ගැන, සහ ඔබට උපදෙස් ලබා ගැනීම සඳහා යා හැකි ස්ථාන ගැන මූලික හැඳින්වීමක් ලබා දෙනු ඇත. ඔබට අවශ්‍ය සේවා සොයා ගැනීමට සහ එම සේවාව හා සම්බන්ධ වීමට එය උපකාරී වනු ඇත.

ඇතුළත් වන සේවාවන් වනුයේ:

- විශේෂ ප්‍රතිලාභ (Special Benefit), කුළී සහාය (Rent Assistance) සහ පවුල සහාය ගෙවීම් (මානව සේවා දෙපාර්තමේන්තුව) (family assistance payments) (Department of Human Services) වැනි සමහර සමාජ ආරක්ෂණ ගෙවීම් (social security payments)
- සේවා නියුක්තිය — රැකියාවක් සොයා ගැනීම සහ ආබාධිත සේවානියුක්ති සේවා (Disability Employment Services)
- මෙඩිකෙයා (Medicare) ඇතුළත්, සෞඛ්‍ය සේවා
- මානසික සෞඛ්‍ය සහ ආවේගාත්මක සුභසාධන සේවා (වධහිංසාව සහ ක්ෂතිය සඳහා උපදේශනයද ඇතුළත්)
- පාසල් යන වයසේ ළමුන් සඳහා අධ්‍යාපනය
- සංකීර්ණ සිද්ධි (Complex Case Support) සඳහා සහාය සහ නොමිලේ භාෂා සහ කථා පරිවර්තන සේවා (සමාජ සේවා දෙපාර්තමේන්තුව)

ඔබට ලබා ගත හැක්කේ කුමන සේවාද යන්න තීරණය වනුයේ ඔබගේ වීසා කොන්දේසි මතය. SHEV සහිතව සිටින විට, ඔබ සුදුසුකම් ලබන ඕනෑම සමාජ ආරක්ෂණ ප්‍රතිලාභයක් (social security benefits) ලබා ගැනීමට ඔබට හැකි වේ. කෙසේවෙතත් SHEV ක්‍රියාමාර්ග වැඩ අවශ්‍යතා සපුරාලීමට, ඔබ සමාජ ආරක්ෂණ ගෙවීම් නොලබා මාස 42 ක් වැඩ කළ යුතු වේ.වැඩි විස්තර සඳහා සංක්‍රමණික හා දේශසීමා ආරක්ෂණ (Department of Immigration and Border Protection) වෙබ් අඩවිය[1] වෙත යන්න.

සේවා සඳහා ලියාපදිංචි වන විට ඔබ ඔබේ සංක්‍රමණික තත්වය සාක්ෂි (EIS) **ඉමිකාඩ් (ImmiCard)** භාවිතා කළ යුතු වේ.

EIS ImmiCard ඉල්ලුම් කිරීමේ වෙබ් අඩවිය[2] තුළින් ඔබට EIS ImmiCard එකක් සඳහා අයදුම් කළ හැකි වේ.

සංක්‍රමණ හා දේශසීමා ආරක්ෂණ වෙබ් අඩවිය[3] තුළින් ඔබට EIS ImmiCard ගැන වැඩිදුර විස්තර ලබා ගත හැකිය.

ඔබට අනෙකුත් සේවාවන් සඳහාද සුදුසුකම් ලැබීමට ඉඩ තිබේ. වැඩි විස්තර සඳහා, මානව සේවා දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වන්න:

- සෙන්ට්‍රලින්ක් (Centrelink): පෙ.ව. 8:00 – ප.ව. 5:00 (දේශීය වේලාව), සඳුදා සිට සිකුරාදා දක්වා, **131 202.**

[1] http://www.border.gov.au/Trav/Refu/Illegal-maritime-arrivals

[2] http://www.border.gov.au/about/corporate/information/forms/online/evidence-of-immigration-status-card-immicard-request

[3] http://www.border.gov.au/Trav/Refu/Immi

- මෙඩිකෙයා, ළමා සහාය (Child Support): පෙ.ව. 8:00 – ප.ව. 5:00 (දේශීය වේලාව), සඳුදා සිට සිකුරාදා දක්වා, **131 450.** මෙය භාෂා පරිවර්තන සහ කථා පරිවර්තන සේවාව වේ (TIS ජාතික) (TIS National).

සමාජ ආරක්ෂණ (Social security) සහ පවුල් සහාය ගෙවීම් (Family assistance payments)

ඔබට ලබා ගත හැක්කේ කුමක්ද යන්න තීරණය වනුයේ ඔබ දරන වීසා බලපත්‍රය අනුවය. ඔබ දැන සිටිය යුතු **වෙනත්** කොන්දේසි තිබිය හැකිය.

ඔබ සුදුසුකම් අවශ්‍යතා සපුරාලන්නේ නම් ඔබට **විශේෂ ප්‍රතිලාභ** සහ **පවුල් බදු ප්‍රතිලාභ (Family Tax Benefit)** ලබා ගත හැකි වනු ඇත. ඔබ බරපතළ මූල්‍ය අර්බුදයකට මැදි වී සිටී නම්, ඔබට සහ ඔබේ යැපෙන්නන්ට ජීවත් වීමට අපහසු නම් එවිට විශේෂ ප්‍රතිලාභ ගෙවීම්වලට ඔබට උපකාර කළ හැකිය. පවුල් බදු ප්‍රතිලාභ යනු දරුවන් හදාවඩා ගැනීමේ වියදම් දරා ගැනීමට උපකාරී වන කොටස් දෙකක ගෙවීමකි.

විශේෂ ප්‍රතිලාභ සහ පවුල් බදු ප්‍රතිලාභ පිළිබඳ වැඩි විස්තර සඳහා, මානව සේවා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය[4] වෙත යන්න.

ඔබේ පුද්ගලික තත්වය අනුව මානව සම්පත් දෙපාර්තමේන්තුව, මඟින් ගෙවනු ලබන වෙනත් දීමනාද තිබේ. ඒවාට පහත දැ ඇතුළත්ය:

- **ළමා ආරක්ෂණ ප්‍රතිලාභ (Child Care Benefit) සහ ළමා ආරක්ෂණ දීමනාව (Child Care Rebate)** — මඟින් දිගුකාලීන, පවුල් හෝ අවස්ථානුගත දිවා සුරැකුම්, පාසල් වේලාවෙන් පරිබාහිර සුරැකුම්, නිවාඩු කාලයේ සුරැකුම්, පෙර පාසල් සහ බාලාංශ වැනි ළමා ආරක්ෂණයන් සඳහා උපකාර කළ හැකිය. පහත වෙබ් අඩවි වෙත යන්න:
    - ළමා ආරක්ෂණ ප්‍රතිලාභ වෙබ් පිටුව[5]
    - ළමා ආරක්ෂණ දීමනා වෙබ් පිටුව[6].
- **සෞඛ්‍ය ආරක්ෂණ කාඩ්පත (Health Care Card) සහ අඩු ආදායම් සෞඛ්‍ය ආරක්ෂණ කාඩ්පත** — මෙයින් ඔබට ඖෂධීය ප්‍රතිලාභ යෝජනාක්‍රමය (Pharmaceutical Benefit Scheme), ඕස්ට්‍රේලියානු රජය විසින් අරමුදල් සපයන සේවා, යටතේ වෛද්‍යවරයෙකු නියම කරන ඖෂධ අඩු මුදලකට ලබා ගැනීමට උපකාරී වන අතර, අනෙකුත් රජයේ සහනයන් ලබා ගැනීමටද හැකි වේ. පහත වෙබ් අඩවි වෙත යන්න:
    - සෞඛ්‍ය ආරක්ෂණ කාඩ්පත වෙබ් පිටුව[7]
    - අඩු ආදායම් සෞඛ්‍ය ආරක්ෂණ කාඩ්පත් වෙබ් පිටුව[8].
- **ද්විත්ව අනත්දරු විශ්‍රාම වැටුප (Double Orphan Pension)** — මඟින් අනාථ වූ දරුවන්ට හෝ කිසියම් තත්වයන් යටතේ සිය දෙමාපියන්ට හදා වඩා ගැනීමට නොහැකි දරුවන් රැක බලා ගැනීම සඳහා වන වියකම් සඳහා උපකාරී වේ. ද්විත්ව අනත්දරු විශ්‍රාම වැටුප් වෙබ් අඩවිය[9] වෙත යන්න.
- **මළදරු උපත් ගෙවීම (Stillborn Baby Payment)** — 2014 මාර්තු මස 1 දින හෝ ඉන් පසුව ඔබට මළ දරු උපතක් සිදු වුවහොත්, ඔබට මෙම ගෙවීම ලබා ගැනීමට හැකි වේ. මළදරු උපත් ගෙවීම් වෙබ් අඩවිය වෙත යන්න[10].

---

[4] https://www.humanservices.gov.au/customer/services/centrelink/special-benefithttps://www.humanservices.gov.au/customer/services/centrelink/special-benefit

[5] http://www.humanservices.gov.au/customer/services/centrelink/child-care-benefit

[6] http://www.humanservices.gov.au/customer/services/centrelink/child-care-rebate

[7] http://www.humanservices.gov.au/customer/services/centrelink/health-care-card

[8] http://www.humanservices.gov.au/customer/services/centrelink/low-income-health-care-card

[9] http://www.humanservices.gov.au/customer/services/centrelink/double-orphan-pension

[10] http://www.humanservices.gov.au/customer/services/centrelink/stillborn-baby-payment

- **රැකියා අධ්‍යාපනය, සහ පුහුණුව, ළමා ආරක්ෂණ ගාස්තු සහාය (Job Education and Training (JET) Child Care Fee Assistance)** — මෙයින් ඔබ රැකියාවක් අපේක්ෂාවෙන් සිටී නම්, අධ්‍යයනයේ නිරත වේ නම්, හෝ පුහුණුවක් හෝ රැකියා සැලසුමේ (Job Plan) හෝ සහභාගීත්ව සැලසුමේ (Participation Plan) කොටසක් ලෙස ශ්‍රම බලකාය වෙත ඇතුළු වීමට හෝ නැවත ඇතුළු වීම සඳහා රජය විසින් අරමුදල් සම්පාදනය කරන ලද පුනරුත්ථාපන කාර්යයක නිරත වේ නම් අනුමත ළමා ආරක්ෂණ වියදම පියවා ගැනීමට උපකාර කරයි. ළමා රක්ෂණ ගාස්තු සහාය (JET Child Care Fee Assistance) වෙබ් පිටුව වෙත යන්න[11].

- **කුළී සහාය (Rent Assistance)** — ඔබට විශේෂ ප්‍රතිලාභ.වැනි ගෙවීමක් ලැබේ නම් මෙය ඔබට ගෙවීමට ඉඩ ඇත කුළී සහාය වෙබ් පිටුව[12] වෙත යන්න.

- **දෙමාපිය නිවාඩු ගෙවීම සහ පිය සහ සහකරු ගෙවීම (Parental Leave Pay and Dad and Partner Pay) ඇතුළුව මුදල් ගෙවනු ලබන දෙමාපිය නිවාඩු යෝජනා ක්‍රමය** — මෙය තව අලුත උපන් හෝ අලුත හදාගත් දරුවන් රැක බලා ගැනීම සඳහා නිවාඩු ලබා ගන්නා දෙමාපියන්ට ගෙවීම් කිරීමට උපකාරී වේ: පහත වෙබ් අඩවි වෙත යන්න.
    - දෙමාපිය නිවාඩු ගෙවීම් වෙබ් පිටුව[13]
    - පිය සහ හවුල්කරු ගෙවීම් වෙබ් පිටුව[14].

සමහර ගෙවීම් කරනු ලැබිය හැක්කේ ප්‍රතිශක්තිකරණ එන්නත් ලබා දී ඇති හෝ අනුමත ප්‍රතිශක්තීකරණ නිදහස් කිරීමක් සහිත දරුවන් සඳහා පමණි. ලබා දිය යුතු එන්නත් සහ ඒවා ලබා දිය යුතු වයස මානව සේවා දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය[15] තුළින් ලබා ගත හැකිය.

වැඩිදුර විස්තර

වැඩිදුර විස්තර සඳහා:

- ඔබේ ළඟම පිහිටි**සේවා මධ්‍යස්ථානය (Service centre)** වෙත යන්න; ඔබට එය මානව සේවා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය[16] වෙතින් සොයා ගත හැකිය.

- මානව සේවා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය[17] වෙත යන්න ඔබට එහිදී විවිධ ගෙවීම් හා සේවා පිළිබඳ තොරතුරු සෙයා ගත හැකිය . මානව සේවා දෙපාර්තමේන්තුව ගෙවීම් සහ සේවාවන් ලබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන ද පරිවර්තනය කිරීමට කටයුතු කරනු ඇත. — එම සේවාව නොමිලේ ලබා දෙනු ඇත.

- 131 202 ඔස්සේ **මානව සේවා දෙපාර්තමේන්තුවේ බහුභාෂා දුරකථන සේවාව (Multilingual Phone Service)** ඔබේ භාෂාවෙන් කථා කිරීමට කිසියම් අයෙකු ඉල්ලා සිටින්න. උපකාර පෙ.ව. 8:00 – ප.ව. 5:00 (ප්‍රාදේශීය වේලාව), සඳුදා සිට සිකුරාදා දක්වා ලබා ගත හැකිය. එසේම ඔබට මානව සේවා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත[18] වෙත යාමටද පුළුවන.

[11] http://www.humanservices.gov.au/customer/services/centrelink/jobs-education-and-training-child-care-fee-assistance

[12] http://www.humanservices.gov.au/customer/services/centrelink/rent-assistance

[13] http://www.humanservices.gov.au/customer/services/centrelink/parental-leave-pay

[14] http://www.humanservices.gov.au/customer/services/centrelink/dad-and-partner-pay

[15] http://www.humanservices.gov.au/customer/subjects/immunising-your-children

[16] http://humanservices.findnearest.com.au/

[17] http://www.humanservices.gov.au/customer/themes/migrants-refugees-and-visitors

[18] http://www.humanservices.gov.au/customer/services/centrelink/multilingual-phone-service

ඉංග්‍රීසි භාෂාව

ඔබට පහත දැක්වෙන ආකාරයේ වීසා තිබේ නම් ඔබට වැඩිහිටි සංක්‍රමණික ඉංග්‍රීසි වැඩසටහන (Adult Migrant English Program - AMEP) හා වෙත පිවිසිය හැකිය:

- තාවකාලික රැකවරණ වීසා (උප පංතිය 785)
- තාවකාලික (මානුෂීය ගැටළු) වීසා (උප පංතිය 786)
- ආරක්ෂක ක්ෂේමස්ථාන කටයුතු පිළිබඳ වීසා (උප පංතිය 790).

ඔබ AMEP සඳහා සුදුසුකම් ලබයි නම්, ඔබට අධ්‍යයන පැය 510ක් දක්වා ලබා ගත හැකිය.

ඔබේ අවශ්‍යතාවලට සරිලන්නේ කුමන AMEP පංතියද යන්න සම්බන්ධයෙන් ඔබේ සේවා සපයන්නා ඔබට උපදෙස් ලබා දෙනු ඇත. ඔවුන් විසින් මෙය සිදු කරනුයේ ඔබගේ වැඩ සහ පවුලේ තත්වය මෙන්ම ඔබේ වත්මන් ඉංග්‍රීසි භාෂා මට්ටම පදනම් කර ගෙනය. එසේම AMEP න් පසුව ඔබගේ වැඩිදුර අධ්‍යාපන කටයුතු සැලසුම් කර ගැනීමටද ඔවුන් ඔබට උපකාර කරනු ඇත.

වැඩි විස්තර සඳහා, ඔබට ළඟම සිටින සේවා සපයන්නා හා සම්බන්ධ වන්න එසේ නැතහොත් AMEP වෙබ් අඩවිය වෙත යන්න[19].

සේවා නියුක්තිය

ඕස්ට්‍රේලියාවේ රැකියාවක් සොයා ගත හැකි මාර්ග කිහිපයක් තිබේ:

- ඔබට **jobactive** සැපයුම්කරුවන් හරහා රැකියාවක් සොයා ගැනීමට උපකාර කිරීමට jobactive හට හැකි වේ. ඔවුනට ඔබට පහත උපකාර කළ හැකිය:
    - දේශීය රැකියා වෙළඳපල පිලිබඳව සහ රැකියාවක් සොයන ආකාරය, සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම් වන ආකාරයද ඇතුළුව උපදෙස් ලබා දෙනු ඇත
    - ඔබේ ප්‍රදේශය තුළ රැකියා සඳහා යොමු කිරීම්
    - රැකියා සැලැස්මක් නිර්මාණය කිරීමට සහාය ලබා දීම, එමගින් ඔබට ආදායම් සහාය ලබා ගන්නා අතරතුර ලැබෙන සේවා සහ ඔබ විසින් සිදු කළ යුතු ක්‍රියාකාරකම් ලැයිස්තුගත කරයි
    - ඔබේ විභවතා සහ ඔබේ රැකියාව සඳහා ඇති සූදානම් භාවය වැඩි කර ගැනීමේදී මුහුණ දීමට සිදු වන අභියෝග හඳුනාගැනීම
    - ජීවදත්ත වාර්තාවක් සකස් කර එය jobactive වෙබ් අඩවියට පැටවීම සඳහා වන සහාය
    - නව කුසලතා ඉගෙනීමට සහ රැකියාවක් සොයා ගැනීම සඳහා වන ඔබට ඇති ඉඩ ප්‍රස්ථා වැඩි කිරීමට උපකාර පිණිස රැකියා විරහිත දීමනාව (Work for the Dole) හෝ ඔබට රැකියාවක් වැනි පළපුරුද්දක් ලබා ගැනීමට හැකි වන වෙනත් සුදුසුකම් ලබන ක්‍රියාකාරකමක් සම්පූර්ණ කිරීමට සහාය ලබා දීම
    - රැකියාවක් ලබා ගැනීමට සහ එය තබා ගැනීමට ඔබේ පළපුරුද්ද සහ කුසලතා ගොඩනංවා ගැනීම සඳහා සහාය
    - වේතන පිහිටාධාර හෝ ප්‍රතිස්ථාපන සහාය (සුදුසුකම් ලබයි නම්) ලබා ගැනීමට උපකාර
    - ඔබ රැකියාවක් ආරම්භ කළ පසුව ඔබේ සැපයුම්කරු වෙතින් අඛණ්ඩ සහාය සහ උපකාර
    - ඔබ ඔබටම අයත් කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වයි නම් නව ව්‍යාපාර ආරම්භ කිරීමේ යෝජනාක්‍රමය (New Enterprise Incentive Scheme) වෙත ප්‍රවේශය (සුදුසුකම් ලබයි නම්).

[19] http://www.education.gov.au/amep

ඔබට ආසන්නතම මානව සේවා දෙපාර්තමේන්තු මධ්‍යස්ථානය (Department of Human Services Centre) වෙත යාමෙන් හෝ **13 28 50** ඇමතීමෙන් ඔබ සුදුසුකම් ලබන්නේද යන්න පරීක්ෂා කර ගත හැකිය.

Jobactive, පිළිබඳ වැඩි විස්තර සඳහා [සේවානියුක්ති දෙපාර්තමේන්තු (Department of Employment) වෙබ් අඩවිය වෙත යන්න][20].

- ජන වාර්ගික-සංස්කෘතික සංවිධාන. ඔබේ නගරය තුළ ඔබේ සංස්කෘතික කණ්ඩායමට සංවිධානයක් තිබෙනු ඇත.
- සේවානියුක්තික නියෝජිතායතන. පෞද්ගලික සේවානියුක්තික නියෝජිතායතන පුද්ගලයින්ට රැකියා සොයා ගැනීමට උපකාර කරයි (සාමාන්‍යයෙන් වෘත්තීමය රැකියා). මෙම සේවාව සඳහා ගාස්තුවක් අය කෙරෙනු ඇත.

ඔබ රැකියාවක් සොයමින් සිටින්නේ නම් මානව සේවා දෙපාර්තමේන්තු මධ්‍යස්ථාන තුළ ස්වයං සේවා පරිගණක තිබේ. ඔබට ජීවදත්ත වාර්තාවක් සකස් කර මුද්‍රණය කර ගැනීම සඳහා මෙම පහසුකම් භාවිතා කළ හැකිය. ඔබට ආසන්නම සේවා මධ්‍යස්ථානය සොයා ගැනීමට මානව [සේවා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වෙත යන්න][21].

ඔබ ආබාධිත තැනැත්තෙකු නම්

ඔබ පූර්ණකාලීන ආබාධිතයෙකු නම් සහ සේවා ස්ථානය තුළ දිගුකාලීන, නිත්‍ය, අඛණ්ඩ සහාය වුවමනා බවට ඇගයීම් කළ අවශ්‍යතාවයක් ඇත්නම් ඔබට **Disability Employment Services ආබාධිත සේවානියුක්ති සේවා** වෙත පිවිසිය හැකිය.

මෙම සේවාවට පහත දෑ ඇතුළත් වේ:

- පුහුණුව සහ නිශ්චිත රැකියා කුසලතා ලබා ගැනීම ඇතුළුව රැකියා සඳහා සූදානම් වීමට උපකාර කිරීම
- ජීවදත්ත වාර්තා සැකසීම, සම්මුඛ පරීක්ෂණ කුසලතා පුහුණුව සහ සුදුසු රැකියා සෙවීම වැනි රැකියා සෙවීම සඳහා වන උපකාර
- මුලින්ම රැකියාවක යෙදවූ විට සහාය, ඊට රැකියාව කරන අතරතුර ලබා දෙන පුහුණුව සහ සම සේවක සහ සේවායෝජකයාගේ සහායද ඇතුළත්ය
- අවශ්‍ය නම් රැකියාවක අඛණ්ඩ සහයෝගය ලබාදීම
- වෘත්තීය පුහුණුව සහ වෙනත් සේවානියුක්තිය හා අදාල සහාය මිලට ගැනීම
- සේවාස්ථාන නවීකරණ කටයුතු, උපකාරක සේවා සහ සේවා ස්ථානය තුළ ඔස්ලන් (ඕස්ට්‍රේලියානු සංඥා භාෂාව - Auslan (Australian Sign Language) භාෂණ පරිවර්තන සේවා ලබා ගැනීමට උපකාර කිරීම
- ඔබේ ආබාධිතභාවය, තුවාල සිදු වීම හෝ සෞඛ්‍ය තත්වය මත ඔබේ රැකියාව අහිමි වීමේ අවදානමක් තිබේ නම් සහාය ලබාදීම.

ආබාධිත සේවානියුක්ති සේවා පිළිබඳ වැඩි විස්තර සඳහා, [ආබාධිත සේවානියුක්ති සේවා (Disability Employment Services) වෙබ් අඩවිය][22] වෙත යන්න.

[20] https://www.employment.gov.au/jobactive

[21] http://humanservices.findnearest.com.au/

[22] http://www.humanservices.gov.au/customer/services/centrelink/disability-employment-services

සේවක අයිතිවාසිකම් සහ කොන්දේසි

ඕස්ට්‍රේලියාවේ සේවකයෙකු ලෙස, අවම වැටුප්, දීමනා, අතිකාල, දඬුවම් මුදල්, වැඩ පැය ගණන, අසනීප නිවාඩු, සේවාස්ථානයේ ආරක්ෂාව සහ තවත් බොහෝ දෑ සහතික කරන යම් යම් හිමිකම් තිබේ. මේවා විවිධ ප්‍රාන්තයන්හි විවිධ වේ, එබැවින් නිශ්චිත විස්තර සඳහා ඔබ ඔබේ සේවා යෝජකයා වෙතින් විමසිය යුතුය. ඔබට තිබෙන හිමිකම් එම සේවා ස්ථානයේ සිටින වෙනත් සේවකයින්ට ඇති හිමිකම්වලට සමාන වේ.

රැකියාවල විවිධ කොන්දේසි තිබේ. ඒවා ස්ථිර ඒවා විය හැකිය, එවිට ඔබට අසනීප නිවාඩු සහ වැටුප් සහිත නිවාඩු කාල ලැබෙන අතර, අනියම් නම්, ඔබට වැටුප් ලැබෙනුයේ ඔබ වැඩ කරන පැය ගණන් සඳහා පමණි.

ඔබට පූර්ණකාලීනව හෝ අර්ධකාලීනව වැඩ කිරීමට පුළුවන් අතර, ඒ කාර්යාල වේලාවන් තුළදී හෝ රාත්‍රියේ විය හැකිය. ඔබේ පවුලේ කටයුතුවලට අමතර ඔබට වැඩ කළ හැකි පැය ගණනක් සඳහා වන රැකියාවක් පමණක් භාර ගැනීම වැදගත් වේ.

වැඩි විස්තර සඳහා ෆෙයා වර්ක් ඔම්බුඩ්ස්මන් (Fair Work Ombudsman) වෙබ් අඩවිය[23] වෙත යන්න. Fair Work Ombudsman සතුව භාෂා 27 කින්[24] තොරතුරු තිබේ.

වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව

සිය සේවා ස්ථානය තුළ සේවකයින් ආරක්ෂා කිරීම සඳහා සෑම ප්‍රාන්තයක් සහ දේශසීමාවකම නීති තිබේ. මෙම නීතිවලට ප්‍රමාණවත් පහසුකම් සහිත ආරක්ෂිත සේවා පරිසරයක් සැපයීම, සිදු විය හැකි සේවා ස්ථාන අනතුරු පිළිබඳව සේවකයින්ට පුහුණුව ලබා දීම, සේවකයින්ගේ සෞඛ්‍ය තත්වය අධීක්ෂණය කිරීම සහ ඔවුනට සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ උපදෙස් ලබා දීමට සුදුසුකම් සහිත පුද්ගලයින් සැපයීම වැනි දෑ ඇතුළත්ය.

සියලුම සේවකයින් මෙම සෞඛ්‍ය හා ආරක්ෂාව හා අදාළ ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය. මීට කළමනාකාරිත්වය සමඟ සුහදව කටයුතු කිරීම, ආරක්ෂක ඇඟළුම් පැළඳීම සහ සේවා ස්ථානය තුළ තම කටයුතුවලින් ඔවුන්ම හෝ අනෙකුත් අය අනතුරෙහි නොහෙළන බවට වග බලා ගැනීම ඇතුළත් වේ. වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ වැඩි විස්තර සඳහා සේෆ් වර්ක් ඕස්ට්‍රේලියා (Safe Work Australia) වෙබ්අඩවිය[25] වෙත යන්න.

[23] http://www.fairwork.gov.au/employee-entitlements

[24] http://www.fairwork.gov.au/contact-us/language-help

[25] http://www.safeworkaustralia.gov.au/sites/swa/pages/default

සෞඛ්‍ය සේවා

මෙඩිකෙයා යනු ඕස්ට්‍රේලියාවේ ජාතික සෞඛ්‍යාරක්ෂණ ක්‍රමය වේ. මෙඩිකෙයා මඟින් නොමිලේ වෛද්‍ය ගාස්තු සහිතව රෝහල් රැකවරණය සහ උපකාර සැපයේ. මෙඩිකෙයා මඟින් ගිලන් රථ වියදම්, බොහෝ දන්ත සේවා, කායික චිකිත්සාව, ඇස් කණ්නාඩි, පාද පරීක්ෂණ, කශේරු සන්ධි පරීක්ෂණ සේවා, හෝ පෞද්ගලික රෝහල්වල නේවාසික වියදම් සඳහා **ගෙවීම් කරනු නොලැබේ.**

මෙඩිකෙයා පහසුකම් ලබා ගැනීම සඳහා, ඔබ ලියාපදිංචි විය යුතු වේ. ලියාපදිංචි වීම සඳහා, ඔබ **මානව සේවා දෙපාර්තමේන්තු මධ්‍යස්ථානයක්** වෙත යා යුතු අතර සම්පූර්ණ කරන ලද මෙඩියෙකා සඳහා ඇතුළත් වීමේ අයදුම්පත්‍රයක්, ඔබේ ඉමිකාඩපත සහ ඔබේ වීසා පිළිබඳ සාක්ෂි (නිදසුනක් ලෙස සංක්‍රමණ හා දේශසීමා ආරක්ෂණ දෙපාර්තමේන්තුවේ ලිපියක්) රැගෙන යා යුතුය. ඔබට ඔබේ වීසා පිළිබඳ සාක්ෂි සැපයිය නොහැකි නම්, සේවා නිලධාරීන්හට ඔබේ අවසරය සහිතව ඔබේ වීසා තත්වය ඔන්ලයින් ආකාරයට පරීක්ෂා කළ හැකිය. ඔබට ළඟම පිහිටි සේවා ස්ථානය සොයා ගැනීමට මානව සේවා දෙපාර්තමේන්තු වෙබ්අඩවිය[26] වෙත යන්න.

ඔබට භාවිතා කිරීමට තාවකාලික Medicare මෙඩිකෙයා කාඩපතක් සහ අංකයක් ලබා දෙනු ඇත. ඔබේ Medicare මෙඩිකෙයා කාඩපත ආසන්න වශයෙන් සති තුනකට පසුව ඔබ වෙත තැපැල් කර එවනු ඇත. ඔබ වෛද්‍යවරයෙකු හමු වීමට හෝ රෝහලකට යන සෑම අවස්ථාවකම එය රැගෙන යා යුතුය.

ඔබ වෛද්‍යවරයෙකු හමු වන විට, ඔවුන් "ඒකාබද්ධ බිල්පත්" සිදු කරනු ඇත. එයින් අදහස් වනුයේ වෛද්‍යවරයා Medicare මෙඩිකෙයා වෙත හිමිකම් පෑම් සිදු කරන අතර එම සේවා සඳහා ඔබ මුදල් ගෙවීම අවශ්‍ය නොවේ. ඔබේ වෛද්‍යවරයා ඒකාබද්ධ බිල්ගත කිරීම් සිදු නොකරන්නේ නම්, ඔබේ ප්‍රතිකාර සඳහා මුදල් ගෙවන ලෙස ඔබට දන්වනු ලබන අතර ඔබට එම වියදම්න් කොටසක් Medicare මෙඩිකෙයා වෙතින් හෝ ඔබේ පෞද්ගලික සෞඛ්‍ය රක්ෂණ අරමුදලින් ලබා ගත හැකිය. ඔබ වෛද්‍යවරයෙකු හමු වීමට යන අවස්ථාවල ඔබ Medicare මෙඩිකෙයා කාඩපත (සහ ඔබට සෞඛ්‍යාරක්ෂණ කාඩපතක් තිබේනම් එයද) රැගෙන යා යුතුය.

වැඩි විස්තර සඳහා මානව සේවා දෙපාර්තමේන්තු වෙබ්අඩවිය[27] වෙත යන්න.

සාමාන්‍ය වෛද්‍යවරුන් (General practitioners (GP))

ඔබට කිසියම් සෞඛ්‍යමය ගැටළුවක් ඇත්නම් සහ එය හදිසි තත්වයක් නොවේ නම්, ඔබ මුලින්ම යා යුත්තේ ඔබගේ පවුලේ වෛද්‍යවරයා (පොදුවේ 'සාමාන්‍ය වෛද්‍යවරයා' හෝ GP ලෙසද හඳුන්වන) වෙත හෝ වෛද්‍ය මධ්‍යස්ථානයක් වෙතය. ඔබ යන වෛද්‍යවරයා හෝ වෛද්‍ය මධ්‍යස්ථානය ඔබටම තෝරා ගත හැකිය – ඒවා කහ පිටු **(Yellow Pages)** දුරකථන නාමාවලිවල වෛද්‍ය වෘත්තිකයන් යටතේ ලැයිස්තුගත කර තිබෙන අතර එසේ නැතහොත් කහ පිටු වෙබ් අඩවියේ[28] තිබේ. තවද, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවාවන් ද Health Direct Australia වෙබ් අඩවියෙහි[29] ඇත. ඔබ වෛද්‍යවරයා වෙත යාමට පෙර ඔහු වෙතින් හමුවීම් අවස්ථාවක්, සාමාන්‍යයෙන් දුරකථන මාර්ගයෙන් වෙන් කර ගත යුතු බවට වෛද්‍යවරයා පවසනු ඇත. හමුවීම් අවස්ථාව සඳහා නියමිත වේලාවට යන බවට වග බලා ගන්න.

වෛද්‍ය උපදේශනවලට සහාය වීම පිණිස වෛද්‍යවරුන් භාෂා සහ භාෂණ පරිවර්තන සේවා Translating and Interpreting Services (TIS National) භාවිතා කරනු ඇත. **131 450** ඔස්සේ මෙම සේවාව වෙත පිවිසෙන ලෙස වෛද්‍යවරයාගෙන් ඉල්ලා සිටීමට ඔබට හැකි වේ.

---

[26] http://humanservices.findnearest.com.au/

[27] http://www.humanservices.gov.au/customer/subjects/medicare-services%20-%20a8

[28] http://www.yellowpages.com.au/

[29] http://www.healthdirect.gov.au/australian-health-services

විශේෂඥ සේවා

වඩා බරපතළ තත්වයන් සඳහා වන ප්‍රතිකාර පිණිස, ඔබේ පවුලේ වෛද්‍යවරයා ඔබව එම තත්වය හා සම්බන්ධ විශේෂඥ දැනුමක් සහිත වෛද්‍යවරයෙකු වෙත යොමු කරනු ලබයි. සාමාන්‍ය යෙන් විශේෂඥ වෛද්‍යවරයෙකු හමු වීමට නම් ඔබ වෛද්‍යවරයාගෙන් හෝ රෝහලකින් ලිපියක් ලබා ගත යුතු වේ. සාමාන්‍ය වෛද්‍යවරයෙකු හමු වීමේ වියදමට වඩා වැඩි වියදමක් විශේෂඥ වෛද්‍යවරයෙකු හමු වීම සඳහා දැරිය යුතු වේ. බොහෝ දුරට විශේෂඥ වෛද්‍යවරයෙකුගෙන් හදිසියේ හමු වීම් අවස්ථාවක් ලබා ගැනීම අපහසු වන අතර ඔබට සති කිහිපයක් හෝ මාස කිහිපයක් බලා සිටීමට සිදු විය හැකිය.

ඖෂධ

ඔබට ඖෂධ ලබා දීමට අවශ්‍ය යැයි ඔබේ වෛද්‍යවරයා සිතුවහොත්, ඖෂධ ශාලාවකින් ලබා ගැනීමට ඔබ වෙත ඖෂධ නිර්දේශයක් ලබා දෙනු ඇත. ප්‍රතිජීවක ඖෂධ වැනි බොහෝ ඖෂධ වර්ග ලබා දෙනුයේ වෛද්‍ය නිර්දේශ මත පමණි. ඔබ ඖෂධ ශාලාවකින් එම ඖෂධ ලබා ගන්නා විට අනිවාර්යයෙන්ම ඔබේ Medicare මෙඩිකෙයා කාඩ්පත රැගෙන යා යුතුය.

ඖෂධ මත ඇති ලේබල් සහ උපදෙස් කියවීම ඉතා වැදගත් වන අතර ඔබට ඒවා නොවැටහේ නම් ඒ ගැන ප්‍රශ්න කළ යුතුය. ඖෂධ පිළිබඳ උපකාර හෝ තොරතුරු පිණිස, සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9 සිට ප.ව. 5 දක්වා වේලාවන් තුළ මෙඩිකෙයා දුරකථන **(Medicine Line)** මාර්ගය අමතන්න. වැඩි විස්තර සඳහා මෙඩිකෙයා දුරකථන මාර්ග වෙබ්අඩවිය[30] වෙත යන්න.

ඔබගේ ඖෂධ ලබා දීමේදී සහාය ලබා ගැනීමට ඖෂධවේදීන්හට භාෂා පරිවර්තන හා භාෂණ පරිවර්තන සේවා Translating and Interpreting Services (TIS National) භාවිතා කළ හැකිය. **131 450** ඔස්සේ මෙම සේවාව භාවිතා කරන ලෙස ඔබට ඔබේ ඖෂධවේදියාගෙන් ඉල්ලා සිටීමට පුළුවන.

රෝහල්

ඕස්ට්‍රේලියාවේ රජයේ සහ පෞද්ගලික රෝහල් තිබේ. රජයේ රෝහල්වලට අරමුදල් සැපයීම රජය විසින් සිදු කරන අතර මෙඩිකෙයා යටතේ රෝගීන්ට නොමිලේ ප්‍රතිකාර පහසුකම් සැපයේ. පෞද්ගලික රෝහල් වෛද්‍යවරුන් විසින් සපයනු ලබන වෛද්‍ය සේවාවන් සඳහා කෙළින්ම රෝගීන්ගෙන් ගාස්තු අය කරන අතර මෙඩිකෙයා මඟින් අනුපාතිකයක් නැවත ලබා දෙන නමුත් රෝගීන් විසින් ඉතිරි කොටස ගෙවිය යුතුය.

ඔබට ළඟම පිහිටි සෞඛ්‍ය සේවාව සොයා ගැනීමට හෙල්ත් ඩිරෙක්ට් ඕස්ට්‍රේලියා (Health Direct Australia) වෙබ්අඩවිය[31] වෙත යන්න.

එම වෙබ් අඩවියේ පහත දෑ ඇතුළත්ය:

- සාමාන්‍ය වේලාවට පසු GP උපකාර මාර්ගය ඇතුළු සෞඛ්‍ය උපදෙස් තොරතුරු (1800 022 222)
- ගර්භණී, උපත් සහ ළදරු උපකාර මාර්ගය[32].

[30] http://www.nps.org.au/contact-us/medicines-line

[31] http://www.healthdirect.gov.au/australian-health-services

[32] http://www.pregnancybirthbaby.org.au/

හදිසි අවස්ථාවකදී

හදිසි අවස්ථාවකදී හෝ හදිසි අනතුරකදී, ඔබට ළඟම පිහිටි රෝහලේ හදිසි ප්‍රතිකාර දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිකාර ලබා ගත හැකිය.

ප්‍රාන්ත සහ දේශසීමාවන්හි රජයේ රෝහල්, ප්‍රජා සහ මහජන සෞඛ්‍යය, ගිලන් රථ, මහජන දන්ත සේවා සහ මානසික සෞඛ්‍ය වැඩසටහන් සඳහා මූලික වගකීම තිබේ. නිශ්චිත තොරතුරු සඳහා Australia.gov.au වෙබ් අඩවිය[33] හි ඔබේ ප්‍රාන්තය හෝ දේශසීමාව තෝරන්න.

ඔබට ගිලන් රථයක් අවශ්‍ය නම්

- ඔබ '000' ඩයල් කළහොත්, ඔබට ගිලන් රථයක්, ගිනි හෝ පොලිස් සහාය අවශ්‍යදැයි විමසනු ඇත.
- ඔබට අවශ්‍ය සේවාවේ නම පවසන්න.
- ඔබට ඉංග්‍රීසි කථා කළ නොහැකි නම්, 'භාෂණ පරිවර්තකයකු' අවශ්‍ය බවත් ඔබ කථා කරන භාෂාවේ නමත් පවසන්න.
- ඔබේ නම, ලිපිනය සහ දුරකථන අංකය පවසන්න.
- සිදු වන්නේ කුමක්ද යන්නත් ඔබ සිටින්නේ කොහේද යන්නත් පවසන්න.
- ඔබ වික්ෂිප්තව සිටී නම් සහ පැවසිය යුත්තේ කුමක්ද යන්න නොදන්නේ නම්, දුරකථනය ආපසු නොතබන්න. ඔබ සිටින්නේ කොතැනද යන්න සොයා ගැනීමට දුරකථන ක්‍රියාකරුට හැකි වනු ඇත.

මතක තබා ගන්න: '000' ඇමතිය යුත්තේ **හදිසි අවස්ථාවකදී** පමණි.

ඔබට ඔබේ භාෂාවෙන් හදිසි අවස්ථා තොරතුරු බිංදු තුන (Triple Zero (000) වෙබ්අඩවිය[34] හි සොයා ගත හැකිය.

උද්ගතව ඇති තත්වය හදිසි එකක් නොවේ නම් ඔබ ඔබේ පවුලේ වෛද්‍යවරයාගෙන් වෛද්‍ය සහාය ලබා ගත යුතුය. ඔබ නිතරම මුලින්ම ඔබේ පවුලේ වෛද්‍යවරයා හා සම්බන්ධ වීමට උත්සාහ දැරිය යුතුය. ඔවුන් එම අවස්ථාවේ නොසිටී නම්, පහත දැක්වෙන සේවාවන්හිදී ඔබගේ ප්‍රශ්නය කුමක්ද ඒ ගැන කුමක් කළ යුතුද යන්න ගැන හදිසි අවස්ථා වෘත්තීමය උපදෙස් ලබා දෙන සුදුසුකම්ලත් හෙදියන් සිටී.

වැඩි විස්තර දැන ගැනීමට ඔබේ ප්‍රාන්තයේ හෝ දේශසීමාවේ දවසේ පැය 24 පුරා, සතියේ දින හත පුරා ඕනෑම අවස්ථාවකදී පහත විස්තර භාවිතා කරන්න

ප්‍රාන්තය / දේශසීමාව	දුරකථන සෞඛ්‍ය උපදෙස් සේවාව	දුරකථන අංකය	වෙබ් අඩවිය
ACT	healthdirect	1800 022 222	www.healthdirect.org.au
NSW	healthdirect	1800 022 222	www.healthdirect.org.au
NT	healthdirect	1800 022 222	www.healthdirect.org.au
QLD	13HEALTH	13 43 25 84	www.health.qld.org.au
SA	healthdirect	1800 022 222	www.healthdirect.org.au
TAS	healthdirect	1800 022 222	www.healthdirect.org.au
VIC	NURSE-ON-CALL	1300 606 024	www.health.vic.org.au

[33] http://www.australia.gov.au/content/health-and-wellbeing-states-and-territories

[34] http://www.triplezero.gov.au/Pages/TripleZero(000)AwarenessCampaignandpromotionalmaterial.aspx

ප්‍රාන්තය / දේශසීමාව	දුරකථන සෞඛ්‍ය උපදෙස් සේවාව	දුරකථන අංකය	වෙබ් අඩවිය
WA	healthdirect	1800 022 222	www.healthdirect.org.au

ගිලන් රථ වියදම්

මෙඩිකෙයා මඟින් ගිලන් රථ ප්‍රවාහනය සඳහා වන වියදම් දරනු නොලැබේ. ඔබ ජීවත් වන ප්‍රාන්තය හෝ දේශසීමාව අනුව ගිලන් රථ වියදම් වෙනස් විය හැකි අතර ඔබට ගිලන් රථ රක්ෂණ ආවරණයක් නොමැති නම් කෙටි දුරක් සඳහා වුවද යන වියදම අධික විය හැකිය.

ක්වීන්ස්ලන්තයේ සහ තස්මේනියාවේ, එම ප්‍රදේශයේ පදිංචිකරුවන් සඳහා ගිලන් රථ සේවාව සාමාන්‍යයෙන් නොමිලේ සපයනු ලැබේ. අනෙකුත් සියලු ප්‍රාන්තවල සහ දේශසීමාවල, ගාස්තු අය කරනු ලැබේ. ඔබ ගිලන් රථයෙන් ගමන් කරන දුර, ඔබේ රෝගයේ ස්වභාවය සහ ඔබ සහන ලබා ගැනීමට සුසුදුකම් ලබන්නේද යන්න අනුව අය කෙරෙන ගාස්තුව වෙනස් විය හැකිය.

ඔබ ජීවත් වනුයේ ක්වීන්ස්ලන්තයට හෝ තස්මේනියාවට පිටතින් නම් ඔබ ගිලන් රථ වියදම් සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ගිලන් රථ සේවාවක් මඟින් සපයනු ලබන සාමාජිකත්ව යෝජනාක්‍රමයක් (උතුරු දේශසීමාව, දකුණු ඕස්ට්‍රේලියාව, වික්ටෝරියා සහ බටහිර ඕස්ට්‍රේලියාවේ ග්‍රාමීය ප්‍රදේශවල) තුළින් හෝ පෞද්ගලික රක්ෂණ අරමුදලක් තුළින් (ඕස්ට්‍රේලියානු අගනුවර දේශසීමාව, නිව් සවුත් වේල්සය සහ නාගරික බටහිර ඕස්ට්‍රේලියාවේ) ලබා සිටිය යුතුය.

මානසික සෞඛ්‍ය ආවේගාත්මක සුභසාධන සේවා / පූර්ව සෞඛ්‍ය ඇගයීම් සහ මැදිහත් වීමේ සේවා (Early Health Assessment and Intervention Services)

පූර්ව සෞඛ්‍ය ඇගයීම් සහ මැදිහත් වීමේ සේවා තුළින් ඔබට සහ ඔබේ පවුලේ අයට කායික සහ මානසික සෞඛ්‍ය ගැටළු මහහරවා ගැනීමට උපකාර කරන අතර හිංසනය සහ ක්ෂතිය සඳහා වන උපදේශනය ඇතුළුව අනෙකුත් සෞඛ්‍ය සේවාවන් සඳහා යොමු කිරීම් සිදු කරයි.

එසේම ඔබව මෙම සේවාවන් වෙත සාමාන්‍ය වෛද්‍යවරුන් සහ අනෙකුත් සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය සපයන්නන්, නීති සේවා, ප්‍රජා සේවා, පවුලේ මිතුරන්/ප්‍රජා සාමාජිකයන්හටද යොමු කළ හැකිය. ඔබට ඔබවම යොමු කරවා ගැනීමටද පුළුවන.

මෙම සේවා සපයනු ලබන්නේ හිංසනයෙන් සහ ක්ෂතියෙන් බේරී සිටින්නන් සඳහා වන ඕස්ට්‍රේලියානු සංසදය Forum of Australian Services for Survivors of Torture and Trauma (FASSTT) විසිනි. මෙය එක් එක් ඕස්ට්‍රේලියානු ප්‍රාන්තයක සහ දේශසීමාවක පිහිටි එක් FASSTT නියෝජිත ආයතනයකි.

ප්‍රාන්තය / දේශසීමාව	සංවිධානය	දුරකථනය	වෙබ් අඩවිය
ACT	කම්පැණියන් හවුස් (Companion House)	02 6251 4550	www.companionhouse.org.au
NSW	STARTTS (හිංසනයෙන් සහ ක්ෂතියෙන් පීඩා විඳින තැනැත්තන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්තාපන සේවා (Service for the Treatment & Rehabilitation of Torture & Trauma Survivors)	02 9794 1900	www.startts.org.au
NT	මෙලලෙයුකා සරණාගත මධ්‍යස්ථානය – හිංසනයෙන් සහ ක්ෂතියෙන් පීඩා විඳින තැනැත්තන් සඳහා උපකාරක සේවා (Melaleuca Refugee Centre – Support Service for Survivors of Torture and Trauma)	08 8985 3311	www.melaleuca.org.au/
QLD	QPASTT (හිංසනයෙන් සහ ක්ෂතියෙන් පීඩා විඳින තැනැත්තන් සඳහා ක්වීන්ස්ලන්ත උපකාරක	07 3391 6677	www.qpastt.org.au

ප්‍රාන්තය / දේශසීමාව	සංවිධානය	දුරකථනය	වෙබ් අඩවිය
	වැඩසටහන) (Queensland Program of Assistance to Survivors of Torture and Trauma)		
SA	STTARS (හිංසනයෙන් සහ ක්ෂතියෙන් පීඩා විඳින තැනැත්තන් සඳහා සහාය සහ පුනරුත්ථාපන සේවා) (Survivors of Torture and Trauma Assistance and Rehabilitation Services)	08 8346 5433	www.sttars.org.au
TAS	ෆිනික්ස් මධ්‍යස්ථානය – හිංසනයෙන් සහ ක්ෂතියෙන් පීඩා විඳින තැනැත්තන් සඳහා උපකාරක සේවා (Phoenix Centre – Support Service for Survivors of Torture and Trauma)	03 6234 9138	www.mrchobart.org.au
VIC	පදනම් මන්දිරය – හිංසනයෙන් පීඩා විඳින තැනැත්තන් සඳහා වන වික්ටෝරියානු පදනම (Foundation House – Victorian Foundation for Survivors of Torture) (VFST)	03 9388 0022	www.foundationhouse.org.au
WA	ASeTTS (හිංසනය සහ ක්ෂතිය සඳහා වන සේවා සංගමය) (Association for Services to Torture and Trauma)	08 9227 2700	www.asetts.org.au

පාසල් යන වයසේ දරුවන් සඳහා අධ්‍යාපනය

රජයේ සහ රජයේ නොවන පාසල්වලදී ඔබට පාසල් යන වයසේ දරුවන් සඳහා අධ්‍යාපනය ලබා ගත හැකිය.

ඕස්ට්‍රේලියාවේ පාසල් යෑම ආරම්භ වන්නේ සූදානම් කිරීමේ වසර සහ ඉන් අනතුරුව එළඹෙන 12 වසරක ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයෙනි.

මට්ටම	**වයස (දළ වශයෙන්)**	**ශ්‍රේණිය**
පෙර-පාසල්	3-5	අ/නැ
බාලාංශය/සූදානම් කිරීමේ/පිළිගැනීමේ/සංක්‍රාන්ති/පූර්ව-ප්‍රාථමික	5-6	අ/නැ
ප්‍රාථමික අධ්‍යාපනය	6-12	1-6
උසස් පාඨශාලා/ද්විතීයික පාඨශාලා	12-18	7-12

*සටහන: සමහර ප්‍රාන්තවල ප්‍රාථමික පාසල් අවසන් වන්නේ **7** වන වසරෙන් වන අතර උසස් පාඨශාලා **8** වසරෙන් ඇරඹේ.*

පෙර පාසලේ සිටින වසර තුල ළමයින්ගේ ශාරීරික, චිත්තාවේගී, සහ සමාජවේගී වර්ධනයන් ඇතිකරලීමට උපකාර වේ.

රජයේ පාසැල්වල නොමිලේ අධ්‍යාපනය ලබා දෙයි. එහෙත් බොහෝ පාසැල්වල පාසැලේ අධ්‍යාපනික සහ ක්‍රීඩා වැඩසටහන් සඳහා ස්වේඡාවෙන් ලබා දෙන මුදලක් හෝ සුළු ගාස්තුවක් අය කරනු ලැබේ. දෙමාපියන් විසින් සැපයිය යුතු අමතර අධ්‍යාපනික උපකරණ හෝ සේවා ඇත. සමහර අවස්ථාවල මේවා සැපයීම වෙනුවෙන් පාසැලට ගෙවිය යුතුය. දෙමාපියන්ට දරුවන්ට සඳහා පැන්සල්, පෑන්, අව්වු පොත් සහ පාසැල් නිල ඇඳුම් ලබා දිය යුතුය.

සියළු පාසැල් ප්‍රධාන ඉගෙනුම් ක්ෂේත්‍රවලින් විෂයයන් උගන්වයි: ඉංග්‍රීසි, ගණිතය, සමාජ සහ පාරිසරික අධ්‍යයනය, විද්‍යාව, කලා, ඉංග්‍රීසි හැර වෙනත් භාෂා, තාක්ෂණය, පුද්ගලික සංවර්ධනය, සෞඛ්‍යය සහ

ශාරීරික අධ්‍යාපනය මේවාය. බොහෝ පාසැල් රජයේ පාසැල් දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගෙන ගන්නා දරුවන්ට අමතර ඉගෙනුම් සහාය English as a second language (ESL) ලබා දෙයි.

ඕස්ට්‍රේලියාවේ පාසැල්වල පංතිකාමර තුළ සහ පිටත විවිධ ආර්ථික සාමාජයීය පසුබිම්මල සිටින දරුවෝ එකට ඉගෙන ගනිමින් අන්තර් ක්‍රියාකාරකම්වල යෙදෙති. බොහෝ පාසැල්වල මිශ්‍ර අධ්‍යාපනය ඇත, එනම් පිරිමි සහ ගැහැණු ළමයින්ට එකම පන්ති කාමරය තුළදී උගන්වනු ලැබේ.

දරුවන් වයස සහ කලින් පාසැල් අධ්‍යාපනය අනුව ශ්‍රේණියකට ඇතුළත් කරනු ලැබේ. එහෙත් සීමිත ලෙස ඉංග්‍රීසි කතා කරන ලාබාල දරුවන් මුලින්ම පහළ ශ්‍රේණියකට ඇතුළත් කිරීමට ඉඩ ඇත.

ඇතුළත් කිරීම ප්‍රතිශක්තිකරණය

ඔබේ දරුවාව පාසැලකට ඇතුළත් කිරීමට පාසල සමග දුරකථනයෙන් සම්බන්ධ වෙන්න නැතහොත් පුද්ගලිකව පාසල වෙත යන්න. ඔබේ දරුවාගේ උපන් දිනය පිළිබඳ තහවුරු කිරීමක්, ඔහුගේ කලින් අධ්‍යාපනය පිළිබඳ ප්‍රගති වාර්තා, දරුවාගේ ඉමිකාඩ්පත පත රැගෙන යාමට සිදු වනු ඇත. ඔබට ප්‍රතිශක්තිකරණ වාර්තා පෙන්වීමටද සිදු වේ.

ඕස්ට්‍රේලියානු නීතියට අනුව ඔබේ දරුවාට ප්‍රාථමික පාසැලට ඇතුළත් වීම සඳහා ප්‍රතිශක්තිකරණ තත්ත්ව සහතිකයක් අවශ්‍යය. මෙම සහතිකය ඔබේ දරුවා ලබා ගෙන ඇති ප්‍රතිශක්තිකරණ පිළිබඳ ප්‍රකාශනයකි.

ඔබේ දරුවාට යම් එන්නත් ලැබිය යුත්තේ කුමන වයසේදීදැයි සොයා ගැනීමට මානව සේවා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය[35] වෙත යන්න.

ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය පිළිබඳ තොරතුරු සඳහා Australia.gov.au වෙබ් අඩවිය[36] වෙත යන්න.

[35] http://www.humanservices.gov.au/customer/services/medicare/australian-childhood-immunisation-register

[36] http://www.australia.gov.au/information-and-services/education-and-training/school-education

සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් සපයන සේවා

සංකීර්ණ සිද්ධි සහායක (Complex Case Support) සේවා

ඔබට හෝ ඔබේ පවුලේ සාමාජිකයන්ට (දරුවන්ද ඇතුළුව) දැඩි හෝ තද අවශ්‍යතා තිබේ නම් සංකීර්ණ සිද්ධි සහායක (CCS) සේවාවන් මාස හයක් දක්වා ඔබට ලබා ගැනීමේ හැකියාව ඇත.

මෙම අවශ්‍යතා පහත සඳහන් හේතු ගණනාවක් නිසා පැන නැගිය හැක:

- සෞඛ්‍ය සහ වෛද්‍ය ගැටළු
- මානසික සෞඛ්‍ය ගැටළු
- නිවසේ හෝ පවුලේ ප්‍රචණ්ඩත්වය
- පුද්ගලික හෝ පවුලේ සම්බන්ධතා පිළිබඳ දුෂ්කරතා
- ඔබේ පවුලේ දරුවන්ට හෝ යෞවනයන්ට බලපාන ගැටළු
- මූල්‍ය හෝ නෛතික දුෂ්කරතා.

පහත දක්වා ඇති පරිදි ඔබම ඇතුළුව සමාජයේ ඕනෑම අයකු විසින්CCS සේවාවන් සඳහා ඔබව යොමු කළ හැක. ඔබව යොමු කිරීමට උපකාර කළ හැකි තවත් සංවිධාන පිළිබඳ උදාහරණ නම්:

- පිළිසරණ පතන්නන්ගේ උපකාරක කණ්ඩායම්
- රජයේ ආයතන
- ප්‍රජා සහ සෞඛ්‍ය සංවිධාන
- දේශීය පල්ලි සහ ස්වේච්ඡා කණ්ඩායම්
- වෛද්‍යවරු, ගුරුවරු, පොලිස් නිලධාරීන් සහ පාසැල් උපදේශකවරු.

CCS වෙත පුද්ගලයන් යොමු කරනු ලබන්නේ සංකීර්ණ සිද්ධි සහාය **ආකෘති පත්‍රය මඟින් වන අතර එය** සමාජ සේවා දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි[37] ඇත. එය **Complex Case Support** කණ්ඩායම වෙත ccs@dss.gov.au යන ලිපිනයට යැවිය යුතුය.

සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර CCS වෙත යොමු කිරීම පිළි ගන්නවාද යන්න තීරණය කරයි. ඔබව CCS සේවාවන් වෙත භාර ගන්නවාද නැද්ද යන්න සඳහන් කරමින් ඔබට ලිපියක් ලැබෙනු ඇත. දෙපාර්තමේන්තුවද ඔබව CCS යොමු කිරීම සම්බන්ධයෙන් ඔබට කතා කරනු ඇත.

[37] https://www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/settlement-services/complex-case-support-programme

නොමිලේ භාෂා පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවා

නොමිලේ භාෂණ පරිවර්තන සේවා

ඔබට භාෂණ පරිවර්තන සේවාව භාවිතා කර මෙඩිකෙයා සහ සාමාන්‍ය වෛද්‍යවරුන්, වෛද්‍ය විශේෂඥයන් සහ ඖෂධවේදීන් විසින් සපයන වෙනස් සේවා උපකාර ලබා ගත හැක.

ක්ෂණික දුරකථන භාෂණ පරිවර්තන සේවා

ඔබට TIS ජාතික මඟින් අංක 131 450 ඇමතීමෙන් ක්ෂණික දුරකථන භාෂණ පරිවර්තන සේවාවන් ලබා ගත හැක. වැඩිදුර විස්තර සඳහා හදිසි අවස්ථා දුරකථන පරිවර්තන වෙබ්පිටුව[38] වෙත යන්න.

කලින් වෙන් කළ දුරකථන භාෂණ පරිවර්තන සේවා

කලින් නියම කර ගත් හමුවීමක් හෝ සම්මුඛ පරීක්ෂණයක් සඳහා ඔබට දුරකථන භාෂණ පරිවර්තන සේවාවක් වෙන් කරන ලෙස සංවිධානයකින් ඉල්ලා සිටීමට සිදු වේ. වැඩිදුර විස්තර සඳහා කලින් වෙන් කරන ලද දුරකථන භාෂණ පරිවර්තන වෙබ් පිටුව[39] බලන්න.

එම ස්ථානයේදීම භාෂණ පරිවර්තනය කිරීමේ සේවා

යම් නිශ්චිත ස්ථානයකදී ඉංග්‍රීසි කතා නොකරන පුද්ගලයන්ට ඉංග්‍රීසි කතා කරන අය සමඟ සන්නිවේදනය කිරීමට එම ස්ථානයේදීම (මුහුණට මුහුණ) භාෂණ පරිවර්තනය කිරීමේ සේවාවන් ඇත. එම ස්ථානයේදීම හමුවීම් සාමාන්‍යයන් ඉංග්‍රීසි කතා නොකරන ගනුදෙනුකරු සමඟ සන්නිවේදන කරන සංවිධානය විසින් වෙන් කරනු ලැබේ. වැඩි දුර විස්තර සඳහා එම ස්ථානයේදීම සන්නිවේදනය කිරීමේ[40] වෙබ් අඩවියට යන්න.

නොමිලේ ලබා දෙන පරිවර්තන සේවා

ඔබටනොමිලේ භාෂා පරිවර්තන සේවා වීසා පංති 449, 786, 785 හෝ 790 ලබා ගැනීමෙන් පසුව වර්ෂ දෙකක් සඳහා භාවිතා කළ හැක. මෙයට ඔබේ පුද්ගලික හැඳුනුම්පත, රියැදුරු බලපත්‍රය, අධ්‍යාපනික සහතික හෝ වෘත්තීය සහතික යන ලේඛන දහයක් දක්වා පරිවර්තනය කර ගැනීමට ඔබට උපකාරී වේ. සුදුසුකම් ලබන ලේඛන සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය[41] බලන්න.

නොමිලේ පරිවර්තන සේවාව (නොමිලේ භාෂා පරිවර්තන සේවා) සඳහා වන අයදුම්පත් ඕස්ට්‍රේලියාව පුරා සිටින වැඩිහිටි සංක්‍රමණික ඉංග්‍රීසි භාෂා වැඩසටහනේ සැපයුම්කරුවන් (Adult Migrant English Program) (AMEP) වෙතදී සිදු කළ හැකිය. ප්‍රාන්තයකම සහ දේශසීමාවකම AMEP සැපයුම්කරුවන් සිටින ස්ථාන සිටින AMEP වෙබ්අඩවියේ පළ කරනු ලැබේ[42].

වැඩිදුර විස්තර

ඉංග්‍රීසි කථා නොකරන පුද්ගලයින් සඳහා නිතර අසනු ලබන ප්‍රශ්න (Frequently Asked Questions) සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂණ දෙපාර්තමේන්තු වෙබ්අඩවියේ[43] සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂණ වෙබ් අඩවියේ පරාසය තුළ ඉංග්‍රීසි කථා නොකරන පුද්ගලයින්හට අපගේ සේවා, ලිපි ලේඛන පරිවර්තනය සහ භාෂණ පරිවර්තකයින් සමඟ කටයුතු කිරීම ගැන තොරතුරු ලබා ගත හැකිය.

---

[38] https://www.tisnational.gov.au/Non-English-speakers/Help-using-TIS-National-services/Immediate-telephone-interpreting-for-non-English-speakers

[39] https://www.tisnational.gov.au/Non-English-speakers/Help-using-TIS-National-services/Pre-booked-telephone-interpreting-for-non-English-speakers

[40] https://www.tisnational.gov.au/Non-English-speakers/Help-using-TIS-National-services/On-site-interpreting-for-non-English-speakers

[41] https://www.dss.gov.au/our-responsibilities/settlement-and-multicultural-affairs/programs-policy/settle-in-australia/help-with-english/free-translating-service

[42] http://www.education.gov.au/amep

[43] https://www.tisnational.gov.au/Non-English-speakers/Frequently-Asked-Questions-for-non-English-speakers